රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 10/99

මගේ අංකය : IX/TU/18
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ -07.

1999.03.24

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථාහා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත.

**පූර්ණ කාලීනව වෘත්තිය සමිති කටයුතු සඳහා**
**මුදා හරිනු ලැබු නිලධාරියෙකුට වැටුප් ගෙවීම**
**ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 5 වන**
**<u>වගන්තිය සංශෝධනය කිරීම</u>**

වෘත්තිය සමිති කටයුතු සඳහා පූර්ණකාලීනව මුදාහැර ඇති නිලධාරියෙක් විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නේ නම් විශ්‍රාම වැටුප් දායක මුදල් වශයෙන් ඔහුගේ වැටුපෙන් 25% ක් අදාළ සංගමය විසින් ගෙවීම අවශ්‍ය නොවන බව රජය තීරණය කර ඇත. ඒ අනුව ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 5:1 උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කරනු ලැබේ.

" 5:1 නිලධාරියා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නෙකු වුවද සංගමය විසින් විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතු නොවේ."

02. මෙම විධිවිධාන 1999.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

(අත්සන)

**ජී.ඒ. සේනාරත්න**
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය